# RESEARCH PRODUCTIVITY AND RESEARCH GROWTH AT THE UNIVERSITY OF KELANIYA: A STUDY BASED ON THE POSTGRADUATE THESES COLLECTION

B.G.S.P. Wimalasiri[1] and A.P.U. De Silva[2]

## Abstract

This study focused on a comprehensive review of postgraduate theses spanning the period from 1960 to 2023, drawing primarily from the repository of postgraduate theses in the main library, University of Kelaniya. The primary objective of this study is to find out the research productivity and growth of the postgraduate degree program offered by the University of Kelaniya. At the same time, this study tried to find research trends in all subject disciplines covered by the University of Kelaniya and identify popular subject areas among postgraduate students. By using the content analysis method, details related to the theses submitted for the degree program Ph.D., M.Phil. M.S.Sc., M.Com. and M.A. collected for this study. Microsoft Excel was used to analyze 2000 theses from the library collection. This study has been done in two stages. Firstly, data was collected from theses, and data was described by using literature from secondary sources to make a clear analysis of the literature. The research findings indicated that most of the studies focused on the Social Sciences and Humanities, particularly at the M.S.Sc. level. However, there were fewer theses submitted for Master of Science (M.Sc) and Master of Art (M.A.) degree programs. The popular fields in the Faculty of Social Sciences were Mass Communication, Library, and Information Science, and the fields of Human Resource Management, Commerce, and Financial Management were the popular fields in the Faculty of Commerce and Management Studies. As recommendations, faculty of Postgraduate studies, the University of Kelaniya should give more attention to other fields rather than Arts and Human Resource Management. Developing new programs in these areas is crucial to enhance research effectiveness. This responsibility extends to both the Faculty of postgraduate studies and other faculties of the university.

**Keywords**: Postgraduate Theses, Research Productivity, Research Development, University of Kelaniya

[1] Assistant Librarian, University of Kelaniya
Email: sulekaw@kln.ac.lk https://orcid.org/0000-0001-6489-5139

[2] Senior Assistant Librarian, University of Kelaniya
Email: udayangani@kln.ac.lk https://orcid.org/0000-0002-8044-2786

Accepted the revised version: 15 November 2023
This work is licensed under CC BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by-sa/4.0/

# කැලණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ඵලදායීතාව හා වර්ධනය: පශ්චාත් උපාධි නිබන්ධන එකතුව අනුසාරයෙන් කරන ලද අධ්‍යයනයකි


**සාරසංක්ෂේපය**

විෂය ක්ෂේත්‍රයන්ට අදාළව සිදු කරනු ලබන පර්යේෂණ ප්‍රවණතා හඳුනාගැනීම ඒ ඒ පර්යේෂකයින්ට මෙන් ම පර්යේෂණ පිළිබඳ ව අවධානය යොමු කරන්නන් වෙත මහගු වටිනාකමක් සපයයි. ඒ තුළින් පර්යේෂකයන් හට ඒ ඒ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ අවස්ථා හඳුනා ගැනීමට හැකි වනු ඇත. මෙම අධ්‍යයනය තුළින් එම පර්යේෂණ පරතරය ආවරණය කිරීමට අවස්ථාවක් කොට ගෙන ඇත. මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ පශ්චාත් උපාධි නිබන්ධන එකතුව මත පදනම්ව 1960 සිට 2023 දක්වා කාලය තුළ දර්ශන විශාරද (Ph.D.), දර්ශනපති (M.Phil.), සමාජීය විද්‍යාපති (M.S.Sc.), වාණිජ විද්‍යාපති (M.Com.), මානව සම්පත් කළමනාකරණ විද්‍යාපති (M.H.R.M.) හා ශාස්ත්‍රපති (M.A.) යනාදී පශ්චාත් උපාධි නිබන්ධන ආශ්‍රයෙන් සිදු කරන ලද විස්තරාත්මක අධ්‍යයනයකි. මෙම අධ්‍යයනයේ දී කැලණිය විශ්වවිද්‍යාලය මඟින් පර්යේෂණ ලෝකයට කරනු ලබන දායකත්වය හා පශ්චාත් උපාධි පර්යේෂණයන්ගේ වර්ධනය පිළිබඳ පුළුල් අවධානයක් ලබා දීමත්, එසේ ම මෙම අධ්‍යයනය තුළින් පශ්චාත් උපාධි හදාරන පර්යේෂකයින් විසින් තෝරා ගනු ලබන විෂය ක්ෂේත්‍රයන් හා වඩාත් ජනප්‍රිය විෂය ක්ෂේත්‍රයන් මොනවාද යන්න සොයා බැලීම, අධ්‍යයනයේ අරමුණු ලෙස යොදා ගෙන ඇත. දත්ත විශ්ලේෂණය සඳහා මයික්‍රොසොෆ්ට් එක්සෙල් (Ms-Microsoft Excel) භාවිතයෙන් ප්‍රධාන වශයෙන් නිබන්ධන දෙදහසක් විශ්ලේෂණය කර ඇත. ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් යටතේ මෙම අධ්‍යයනය සිදු කරනු ලැබේ. එනම්, මූලික ව උපාධි නිබන්ධන දෙදහසක් භාවිතයෙන් දත්ත ලබා ගැනීම, එම දත්ත සාහිත්‍ය ආශ්‍රයෙන් විස්තර කිරීම සහ එම නිගමන සාහිත්‍ය තුළින් වඩාත් පැහැදිලි විශ්ලේෂණයක් සිදු කිරීමය. පශ්චාත් උපාධි නිබන්ධනයන්ගෙන් වැඩි පර්යේෂණ ප්‍රමාණයක් කලා විෂය ක්ෂේත්‍රය නියෝජනය කරන අතර ම සමාජීය විද්‍යාපති උපාධි (M.S.Sc) මට්ටමට අයත් පර්යේෂණ විය. විද්‍යාපති (M.Sc.), ශාස්ත්‍රපති (M.A.) උපාධි වැඩසටහන් සඳහා ඉදිරිපත් කරන ලද උපාධි නිබන්ධන සංඛ්‍යාව අඩු මට්ටමක පැවතිණි. එසේ ම ජන සන්නිවේදනය, පුස්තකාල හා විඥාපන විද්‍යා යන විෂය ක්ෂේත්‍රයන් සමාජීය විද්‍යා පීඨය තුළ ජනප්‍රිය විෂය දහරා වන අතර මානව සම්පත් කළමනාකරණය හා වාණිජ හා මූල්‍ය කළමනාකරණය යන විෂය ක්ෂේත්‍ර වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ ජනප්‍රිය විෂය දහරාවන් ලෙස නිගමනය විය. එහෙයින්, කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨය මඟින් කලා, මානව සම්පත් කළමනාකරණ විෂය ක්ෂේත්‍රයට මෙන් ම අනෙකුත් විෂය ක්ෂේත්‍රයන් කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කර පර්යේෂණ ඵලදායීතාව වර්ධනය කර ගැනීම සඳහා ද නව වැඩපිළිවෙත් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතුය. එය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙන් මෙන් ම විශ්වවිද්‍යාලයීය අනෙතුත් පීඨයන්ගේ ද සාමූහික කාර්ය භාරයක් වනු ඇත.


**ප්‍රමුඛ පද:** පශ්චාත් උපාධි නිබන්ධන, පර්යේෂණ ඵලදායීතාව, පර්යේෂණ වර්ධනය, කැලණිය විශ්වවිද්‍යාලය

## හැඳින්වීම

පර්යේෂණයක් යනු විෂයක් පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයකි, විශේෂයෙන් ම නව තොරතුරු සොයා ගැනීම සඳහා හෝ නව අවබෝධයක් ලබා ගැනීම සඳහා කරනු ලබන අධ්‍යයනයකි (Cambridge Dictionary, 2023). මූලික වශයෙන්, පර්යේෂණය යනු යම්කිසි ගැටලුවක් හා ආශ්‍රිත කරුණු විසඳීම සඳහා විද්‍යාත්මක ක්‍රම භාවිත කරමින් සිදු කරනු ලබන අධ්‍යයනයක් ලෙස අර්ථ දැක්විය හැකිය. පර්යේෂණ මඟින් ඕනෑම විෂය ක්ෂේත්‍රයක් තුළ සමාජයට නව දැනුම නිර්මාණය කරන බව ඉතා පැහැදිලි ය. බොහෝ පර්යේෂණ මඟින් ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රම භාවිත කරමින් ඕනෑම විෂය ක්ෂේත්‍රයක පවතින හිඩැස් පිරවීමට උත්සාහ කරයි (Mittal, 2011). බොහෝ අවස්ථාවන්හි අධ්‍යයන ආයතන සහ පර්යේෂණ ආයතන සිදු කරනු ලබන පර්යේෂණ තුළින් නව දැනුම සහ න්‍යායන් බිහි කිරීමට දායකත්වය සපයයි (Kang & Kang, 2014). මර්චන්ට් (2009) දක්වන පරිදි විශ්වවිද්‍යාල මට්ටමින් පර්යේෂණ සහ පර්යේෂණ සංස්කෘතියක් වර්ධනය කිරීම සඳහා රජයන්ගෙන් පවා ලබා දෙනුයේ සුවිශේෂී දායකත්වයක් වේ. පර්යේෂණ උසස් ප්‍රමිතියක් ලෙස සැලකිය හැකි දේ සහ එවැනි ප්‍රමිතීන් ස්ථාපිත කළ හැකි ආකාරය පිළිබඳව මැනීමේ සංකීර්ණත්වය තිබියදීත් (Ferretti et al., 2018) ජාත්‍යන්තර වශයෙන් පර්යේෂණ නිපුණතාවයේ ප්‍රකාශන ලෙස විශ්වවිද්‍යාල ගෝලීය ශ්‍රේණිගත කිරීම් මගින් පර්යේෂණවල විශිෂ්ටත්වය අවධාරණය කර ඇත. එමගින් ආයතනවල තත්ත්වය, කීර්තිය රඳා පවතී. නවීනතම පර්යේෂණ පැවැත්වීම ලෝක ශ්‍රේණිගත කිරීමේ පද්ධතිවල ප්‍රධාන නිර්ණායකයක් බවට පත්ව ඇත. නිදසුනක් වශයෙන්,

ලෝක විශ්වවිද්‍යාල අධ්‍යයන ශ්‍රේණිගත කිරීම සහ එක්සත් ජනපද ප්‍රවෘත්ති ගෝලීය විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම (Clarivate University Ranking Consultancy Service, 2022) මගින් භාවිත කරන ලද මුළු දර්ශක හෝ ප්‍රමිතිවලින් 50% 'මාත්‍රාව' ග්‍රන්ථමිතික දර්ශකවලින් සමන්විත වේ. එබැවින් විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා දේශීය හා ජාත්‍යන්තර කාර්ය මණ්ඩලය සහ විශ්වවිද්‍යාලයට ආකර්ෂණය වන සිසුන් සංඛ්‍යාවට එය (ශ්‍රේණිගත කිරීම්) බලපෑම් ඇති කරන බැවින් විශ්වවිද්‍යාල මගින් පර්යේෂණවල ගුණාත්මකභාවය සහ එහි බලපෑම සමීපව නිරීක්ෂණය කර පර්යේෂණ ඉහළ නැංවීමේ අවශ්‍යතාවය සුළු කොට තැකිය නොහැකිය (Rambe, 2023).

සෑම විෂය ක්ෂේත්‍රයකම පර්යේෂණ සඳහා සහාය දැක්වීම ඕනෑම අධ්‍යයන ආයතනයක ප්‍රධාන අරමුණු අතර පවතී (Crum, 2015; Oztuk, 2017). එහි එක් ක්‍රමයක් ලෙස පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම සහ එම පර්යේෂණ ප්‍රතිඵල සමාජගත කිරීම සිදු කරනු ලබයි. මේ අතරතුර අධ්‍යයන ආයතන හෝ පර්යේෂණ ආයතන විසින් පර්යේෂණ සිදු කිරීම සහ ඒවායෙහි පවතින ගැටළු සහ ප්‍රතිඵල, නව ප්‍රවණතා සමාජයට සන්නිවේදනය කිරීමේ භාරදූර කාර්යයක නියැළේ (Oztuk, 2017). අධ්‍යයන සහ පර්යේෂණ අවශ්‍යතා සඳහා සහාය දැක්වීම උසස් අධ්‍යයන ආයතනයක ප්‍රධාන අරමුණ වී ඇති අතර සියලුම අධ්‍යයන ආයතනවලට අනුයුක්තව පර්යේෂණ කටයුතු සඳහා පමණක් ම වෙන් වූ දෙපාර්තමේන්තුවක් හෝ අංශයක් පවතී (Crum, 2015). ශ්‍රී ලංකා සන්දර්භය තුළ, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාලනය වන රාජ්‍ය විශ්වවිද්‍යාල දාහතක් ඇත (UGC, 2022). කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම විශ්වවිද්‍යාලයක් වන අතර එය පර්යේෂණ කටයුතු සඳහා ද විශාල දායකත්වයක් සපයන මෙන්ම ලොව ප්‍රමුඛ පෙළේ විද්‍යාඥයින් පිරිසක් සේවයේ නියුතු අධ්‍යයන හා පර්යේෂණ ආයතනයකි. එම විශ්වවිද්‍යාලය මගින් පර්යේෂණ ලෝකයට විශාල දායකත්වයක් සපයා ඇති අතර එය යම් තරමක් දුරට හෝ ගණනය කිරීමට හැකි ද යන්න සලකා බැලීම ඉතා කාලෝචිත වේ. 2021 වසරේ ලොව සුපතල සයිමාගෝහි දර්ශකයට (Scimago Ranking) අනුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතරින් කැලණිය විශ්වවිද්‍යාලය පර්යේණවලින් ප්‍රථම ස්ථානයට පත් උසස් තත්ත්වයේ පර්යේෂණවල නියැලි සිටින කාර්යමණ්ඩලයක් සහිත උසස් අධ්‍යාපන ආයතනයකි. (ජයසුන්දර, 2023). කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිනිය ඇතුළු මහාචාර්යවරුන් සිව්දෙනෙකු 2023 ස්ටැම්ෆර්ඩ්හි ලොව හොඳම 2% විද්‍යාඥයින්ගේ ලැයිස්තුවට අයත් වේ. Times Higher Educations හි ශ්‍රේණිගත කිරීම්වලට අනුව ලෝක ශ්‍රේණිගත කිරීම්වල 1500+ ශ්‍රී ලංකාව තුළ 3 වන ස්ථානය ද QS ආසියානු විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල 551 - 600ත් අතර ද එහි ශ්‍රී ලංකාව තුළ 6 වන ස්ථානය ද, Webometric විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වලට අනුව ලොව 2954 ස්ථානය ද, එහි ශ්‍රී ලංකාවේ හයවන (6) ස්ථානය ද කැලණිය විශ්වවිද්‍යාලය හිමි කරගෙන ඇත. එමෙන්ම 2022 වර්ෂය තුළ THE import ranking හි ශ්‍රී ලංකාව තුන්වන (3) ස්ථානය ද ලෝකය තුළ 601- 800 ත් අතර ද, විශ්වවිද්‍යාල ග්‍රීන් ප්‍රමිතියෙහි (University Green Metrics) ලොව 241 ස්ථානය සහ ඉන් ශ්‍රී ලංකාව තුළ ප්‍රථම ස්ථානය ද කැලණිය විශ්වවිද්‍යාලය ලබාගෙන තිබුණි. විශේෂයෙන් ම, මෙම ශ්‍රේණිගත කිරීම් සඳහා විශ්වවිද්‍යාලයීය පර්යේෂණ, නව සොයාගැනීම් ආදිය ඇගයීමට ලක්ව තිබේ. ශ්‍රේණිගතකිරීම්වල දී විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලයේ කාර්ය සාධනය සහ පර්යේෂණවල මෙන් ම ජාතික සහ ජාත්‍යන්තර ශිෂ්‍ය ශිෂ්‍යයාවන්ගේ ආකර්ෂණය දිනා ගැනීමට ද මෙම ශ්‍රේණිගතකිරීම් ප්‍රබලව බලපෑම් එල්ල කරයි. කැලණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ පර්යේෂණ තුළින් සිදු කරනු ලබන නව සොයා ගැනීම් ආශ්‍රයෙන්, Scopus වැනි දත්ත පද්ධති තුළ දර්ශක (Index) වන විද්වත් ශාස්ත්‍රීය ලේඛන ඉදිරිපත් කරනු ලබන ආචාර්ය මණ්ඩලයට උපකුලපති සම්මාන ලබාදීම, සනාතන සභා සම්මාන ලබාදීම ආදිය තුළින් පර්යේෂකයන් දිරිමත් කිරීම විශ්වවිද්‍යාලයක් වශයෙන් වර්තමානයේ දී සිදු කරනු ලැබේ.

1959 ආරම්භ කරන ලද විද්‍යාලංකාර පිරිවෙන විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, විද්‍යාලංකාර මණ්ඩපය සහ කැලණිය විශ්වවිද්‍යාලය බවට පත්වීමත් සමග ම 1998 වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය ආරම්භ කිරීමෙන් අනතුරුව පශ්චාත් උපාධි පාඨමාලා වර්ධනය වීමත් පර්යේෂණ ලෝකයට නව ඵලදායි පර්යේෂණ බිහිවීමත් සිදුවිය. පශ්චාත් උපාධි පීඨය මගින් වාණිජ හා ව්‍යාපාර කළමනාකරණ, පරිගණක අධ්‍යයන, තාක්ෂණය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර, වෛද්‍ය විද්‍යා, බහු විෂයයීය අධ්‍යයනය සහ මාර්ගගත ඉගෙනුම් ඔස්සේ පශ්චාත් උපාධි පාඨමාලා හැට දෙකක් (62) පවත්වාගෙන යනු ලැබේ (කැලණි සරසවි පුනරවලෝකනය, 2023). එමෙන් ම පශ්චාත් උපාධි පීඨය මගින් 2000 වර්ෂයේ දී පමණ ආරම්භ කරනු ලැබූ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය 2015 වර්ෂයේ සිට අන්තර්ජාතික පශ්චාත් උපාධි පර්යේෂණ සම්මන්ත්‍රණයක් (International Postgraduate Research Conference -IPRC) ලෙස වාර්ෂිකව පවත්වාගෙන යනු ලැබේ. මෙලෙස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨය මගින් පර්යේෂණ ලෝකයට දායාද කරනු ලබන පර්යේෂණ ප්‍රමාණය අතිවිශාලය.

විවිධ විෂය ක්ෂේත්‍රයන් යටතේ ඵලදායිතාව හා වර්ධනය පිළිබඳව සාහිත්‍ය විශාල ප්‍රමාණයක් ලිය වී තිබුණ ද ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි පර්යේෂණයන්හි වර්ධනය පිළිබඳව අවධානය යොමු වී ඇත්තේ අල්ප වශයෙනි. එහෙයින් විශේෂයෙන් ම කැලණිය විශවවිද්‍යාලයේ පශ්චාත් උපාධි පර්යේෂණයන්ගේ පර්යේෂණ ඵලදායිතාව හා වර්ධනය පිළිබඳ ව මෙතෙක් කිසිදු පර්යේෂණයක් සිදු නොවී ඇති අතර එම හිඩැස සම්පූර්ණ කිරීම පිණිස පශ්චාත් උපාධි නිබන්ධන ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සිදු කර ඇත. මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වූයේ කැලණිය විශ්වවිද්‍යාලය මඟින් පර්යේෂණ ලෝකයට කරනු ලබන දායකත්වය හා පශ්චාත් උපාධි පර්යේෂණයන්ගේ වර්ධනය පිළිබඳ පුළුල් අවධානයක් ලබා දීම වේ. එසේ ම මෙම අධ්‍යයනය තුළින් අපේක්ෂා කෙරෙනුයේ පශ්චාත් උපාධි හදාරන පර්යේෂකයින් විසින් තෝරා ගනු ලබන විෂය කෂේත්‍රයන් හා වඩාත් ජනප්‍රිය විෂය කෂේත්‍රයන් මොනවාද යන්න පිළිබඳ සොයා බැලීමත් ය.

**සාහිත්‍ය ගවේෂණය**

ඕනෑම ආයතනයක සහ වෘත්තියක සාමාජිකයින්ගේ කාර්ය සාධන ඇගයීම, ඔවුන්ගේ ශක්තීන් සහ දුර්වලතා හඳුනාගැනීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එය සාමාජිකයින්ගේ හැකියාවන් සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා සුදුසු වැඩසටහන් සහ ප්‍රතිපත්ති සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට එම ආයතනවලට උපකාර විය හැක (Monsura et al, 2022). ගෝලීය ඉල්ලුමට අනුව උසස් අධ්‍යාපනයේ පර්යේෂණ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා, "පර්යේෂණ නිෂ්පාදන අවශ්‍යතා පර්යේෂණ කාර්ය සාධනය අනුව තනි තනි විද්වතුන්ට මෙන් ම ඔවුන්ගේ ආයතනවලට ශ්‍රේණිගත කිරීම සඳහා බලපෑමක් ඇති කරන බව" නීම්සික් සහ රෝසොව් (Niemczyk and Rossouw, 2019) පෙන්වා දී ඇත. තවදුරටත් පර්යේෂණ කාර්ය සාධනයෙහි වෙනස්වීම අධ්‍යයනය සහ පරිඥානයක් සැපයීම, රම්බේ (Rambe, 2023) උසස් අධ්‍යාපනයේ වෙනසත් සමග අධ්‍යයන පුස්තකාලවල සහ නායකත්වය තුළ දක්නට ලැබෙන ප්‍රධාන බලපෑම සහ උපනතීන් පිළිබඳව අස්ලාම් (Aslam, 2018) පැහැදිලි කර තිබේ. ලොව පුරා රටවල සංවර්ධනයේ දී පර්යේෂණ ඵලදායිතාව ඉහළ නැංවීම ඉතා වැදගත් වේ (Rossouw, 2020).

ඉස්ලාම් සහ වෙනත් අය (Islam, et al, 2018) විසින් බංග්ලාදේශයේ පුස්තකාල සහ තොරතුරු විද්‍යාවේ පර්යේෂණ ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙම අධ්‍යයනයෙන් පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රය පිළිබඳ කෙටි හැඳින්වීමක් සපයන ලද අතර 1980 සිට 2016 දක්වා කාලය තුළ සඟරා 62ක පළ වූ ලිපි 200ක් සමාලෝචනය කරන ලදී. විශ්ලේෂණාත්මක දත්ත මඟින් පිරිමි කර්තෘත්වයට වඩා කාන්තා කර්තෘත්වයේ අඩු ලිපි ප්‍රමාණයක් දක්නට ලැබුණ අතර බහුතරයක් එක්සත් රාජධානියෙන් ප්‍රකාශයට පත්කර ඇත. එමෙන් ම, ප්‍රකාශිත ලිපිවල වඩාත්ම ජනප්‍රිය උප ක්ෂේත්‍රය වූයේ ඩිජිටල් පුස්තකාලය.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ ඵලදායිතාව පිළිබඳව (Wijetunge et al., 2020; Wijetunge, 2021) සහ පර්යේෂණ ඵලදායිතාව මැනීම සඳහා ප්‍රවේශයන් දෙකක් භාවිත කර ඇති බව සාහිත්‍ය විමර්ශනයේදී පැහැදිලි ය. ක්ෂුද්‍ර ආර්ථික විද්‍යා ප්‍රවේශය සහ ග්‍රන්ථමිතික ප්‍රවේශය වැනි ප්‍රවේශයන් තුළින් පර්යේෂණ ඵලදායීතාවය මැනීම විවිධ පර්යේෂකයන් විසින් අනුගමනය කර ඇත (Leydesdorff, 2013; Abramo & D'Angelo, 2014; Aponsu, 2017; Günay & Haliloglu, 2018; Bornmann & Erfanmanesh, Tahira and Abrizah, 2017 and Gadhoum and Karam, 2016). මීට අමතරව, SciVal වැනි පර්යේෂණ බුද්ධි මෙවලම් මඟින් විවිධ පර්යේෂණ ප්‍රමිති භාවිතයෙන් පර්යේෂණ ඵලදායිතාව ඇගයීමට හැකියාව ලැබේ (Wijetunge et al., 2020). ලොව පුරා විවිධ විෂය ක්ෂේත්‍රයන් යටතේ ඵලදායිතාව හා වර්ධනය මැනීම සඳහා විවිධ ක්‍රම භාවිත කර ඇතිබව ද මෙම සාහිත්‍ය අධ්‍යයනයේ දී පෙනී ගිය කරුණකි.

තවදුරටත් ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ, අංගම්මන සහ ජයතිස්ස (Angammana & Jayatissa (2015) විසින් පුස්තකාල සහ තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි නිබන්ධන පිළිබඳ ග්‍රන්ථමිතික අධ්‍යයනයක් සිදු කරන ලදී. පර්යේෂණය පුරාවට, කැලණිය විශ්වවිද්‍යාලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ M.S.Sc සහ M.L.S. උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධන 70 කින් අධ්‍යයනය සම්පූර්ණ කර ඇත. තෝරාගත් විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි නිබන්ධනවල ග්‍රන්ථමිතික ලක්ෂණ නිර්ණය කිරීම කෙරෙහි පර්යේෂණය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී. එමෙන්ම, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ උපාධි නිබන්ධන ආශ්‍රයෙන් උද්ධරණ විශ්ලේෂණයක් (Kodithuwakku (2017), එකතු සංවර්ධනය සඳහා උපුටා දැක්වීම් විශ්ලේෂණය (Punchihewa, 2014 ; Sureni, 2017) ආදී පර්යේෂණ රැසක් විවිධ අංශයන් ඔස්සේ සිදු කර ඇති බව සාහිත්‍ය ගවේෂණයේ දී මනාව පැහැදිලි වේ.

**පර්යේෂණ ක්‍රමවේදයඃ**

මෙම අධ්‍යයනය විස්තරාත්මක පර්යේෂණ ගණයට යටත් වන අතර ප්‍රාථමික මූලාශ්‍ර, ද්විතීක මූලාශ්‍ර හා සාහිත්‍ය ඇසුරු කරගෙන ක්‍රියාත්මක කරන ලදී. කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයෙහි පශ්චාත් උපාධි නිබන්ධන එකතුව මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන මූලාශ්‍රය වේ. වර්ෂ 1960 සිට 2023 දක්වා කාලය තුළ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙන් එකී එකතුව වෙත උපාධි නිබන්ධන 2000ක් ලබා දී ඇති අතර එම උපාධි නිබන්ධන 2000ම මෙම අධ්‍යයනයෙහි නියැදිය ලෙස යොදා ගෙන ඇත. කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟින් පිරිනමනු ලබන සියලු ම උපාධි පාඨමාලාවන් එනම්, දර්ශන විශාරද (Ph.D.), දර්ශනපති (M.Phil.), සමාජීය විද්‍යාපති (M.S.Sc.), වාණිජ විද්‍යාපති (M.Com.), මානව සම්පත් කළමනාකරණ විද්‍යාපති (M.H.R.M.) හා ශාස්ත්‍රපති (M.A.) යනාදී උපාධීන් සඳහා ඉදිරිපත් කරනු ලබන උපාධි නිබන්ධන සියල්ල මෙම අධ්‍යයනයට අන්තර්ගත වේ. උපාධි නිබන්ධනයන්ගේ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු භාවිතයට ගෙන අන්තර්ගත විශ්ලේෂණයක් (Content analysis) ඔස්සේ මෙහි ප්‍රතිඵල ලබා ගන්නා ලදී. ඒකරාශී කර ගන්නා ලද දත්ත මයික්‍රොසොෆ්ට් එක්සෙල් (Ms-Excel) භාවිතයෙන් විස්තරාත්මකව විශ්ලේෂණය කොට වගු හා ප්‍රස්ථාර භාවිතයෙන් නිගමනයන් ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. එසේ ම ලිඛිත සාහිත්‍ය භාවිත කරමින් අධ්‍යයනයෙන් ලද නිගමනයන් වඩාත් තහවුරු කිරීම මෙම ලිපියෙහි වැදගත් අංගයක් වේ.

**ප්‍රතිඵල සහ සාකච්ඡාවඃ**

මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වූයේ කැලණිය විශ්වවිද්‍යාලය මඟින් පර්යේෂණ ලෝකයට ලබා දෙන්නා වූ දායකත්වය හඳුනා ගැනීම හා පර්යේෂණයන්ගේ වර්ධනය සිදු වී ඇති ආකාරය පිළිබඳ සොයා බැලීම වේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ මූලාරම්භය දෙස බලන කල්හි විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය ප්‍රධාන පීඨ පහකින් යුක්ත විය. එම පීඨ අතර භාෂා, බෞද්ධ, කලා, විද්‍යා සහ දර්ශන සහ පර්යේෂණ පීඨය වශයෙන් දැකගත හැකිය. මෙම පීඨ යටතේ අධ්‍යයන අංශ 18ක් පැවතිණි (කැලණි සරසවි පුනරවලෝකනය, 2023). 1981/82 අධ්‍යයන වර්ෂයේ සිට පැවති කලා පීඨය මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨය වශයෙන් නම් කරනු ලැබීය (කුමාරසිංහ, 2008). විද්‍යා පීඨයේ 1981/82 සිට පශ්චාත් උපාධි ආරම්භය සිදුවීමත්, 1990 වන විට විද්‍යා පීඨයේ සෑම අධ්‍යයන අංශයක ම ආචාර්ය උපාධි පිරිනැමීම ආරම්භ වීමත් සිදු විය (කැලණි සරසවි පුනරාවලෝකනය, 2023). 1998 වන විට කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය ආරම්භ වීම සිදු විය.

මෙම අධ්‍යයනයෙහි එක් අරමුණක් වනුයේ කැලණිය විශ්වවිද්‍යාලය මඟින් පර්යේෂණ ලෝකයට දක්වනු ලබන දායකත්වය හඳුනා ගැනීම වේ. ඒ අනුව බලන කළ කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල එකතුවෙහි උපාධි නිබන්ධන 1910 ක්ම (95.5%) අන්තර්ගත වනුයේ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සහ කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟින් ක්‍රියාත්මක උපාධීන් සඳහාය. එසේම එකතුවෙන් 90ක් (4.5%) උපාධි නිබන්ධනයන් කැලණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය භවතුන් විසින් ශ්‍රී ලංකාවේ වෙනත් විශ්වවිද්‍යාල හා විදේශීය විශ්වවිද්‍යාල සඳහා ඉදිරිපත් කරන ලද උපාධි නිබන්ධනයන්ගේ අනුපිටපත්ය. මෙම අධ්‍යයනය 1960 වර්ෂයේ 2023 වර්ෂය දක්වා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයෙන් සහ කැලණිය විශ්වවිද්‍යාලයෙන් බිහි වූ පශ්චාත් උපාධි නිබන්ධන සඳහා පමණක් අවධානය යොමු කොට ඇති අතර වෙනත් රටවල සිදු කරන ලද අධ්‍යයනයන්ගෙන් පැහැදිලි වනුයේ විශ්වවිද්‍යාල ගණනාවක එකතුන් යොදා ගෙන අධ්‍යයන සිදු කොට ඇති බවය (Chakrabarti, 2020).

පශ්චාත් උපාධි නිබන්ධන එකතුවෙහි අන්තර්ගතය සලකා බැලීමේ දී පෙනී යන්නේ සමාජීය විද්‍යාපති පාඨමාලාව හැදෑරීම සඳහා පර්යේෂකයින් වැඩි වශයෙන් යොමු වන බවයි. එය උපාධි නිබන්ධන 525ක් වන අතර ප්‍රතිශතය 26% ප්‍රමාණයකි. එසේම දර්ශනපති උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා ද යොමු වීමේ වැඩි නැඹුරුවක් දැක ගත හැකිවේ. එය 485 (24%) කි. අනුපිළිවෙලින් දර්ශන විශාරද, මානව සම්පත් කළමනාකරණ විද්‍යාපති, ශාස්ත්‍රපති හා වාණිජ විද්‍යාපති යනාදී උපාධීන් පර්යේෂණ ලෝකයට 15%, 12%, 10% හා 9.5% වශයෙන් දායකත්වය සපයා ඇත. එය වගු අංක 1 හි පැහැදිලි ව ඉදිරිපත් කොට ඇත.

වගු අංක 1: උපාධි ස්වරූපය අනුව නිබන්ධන

| **පිරිනමනු ලබන උපාධීන්** | **නිබන්ධන ප්‍රමාණය** | **ප්‍රතිශතය** |
|---|---|---|
| දර්ශන විශාරද (Ph.D.) | 304 | 15% |
| දර්ශනපති (M.Phil.) | 485 | 24% |
| සමාජීය විද්‍යාපති (M.S.Sc.) | 525 | 26% |
| වාණිජ විද්‍යාපති (M.Com.) | 189 | 9.5% |
| මානව සම්පත් කළමනාකරණ විද්‍යාපති (M.H.R.M.) | 233 | 12% |
| ශාස්ත්‍රපති (M.A.) | 200 | 10% |
| එකතුව | 2000 | 100% |

(මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023)

කැලණිය විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි නිබන්ධන එකතුව භාෂාව අනුව සහ පීඨයන් අනුව සලකා බැලීමේ දී ඉංග්‍රීසි මාධ්‍යයෙන් රචිත උපාධි නිබන්ධනයන්ගේ සංඛ්‍යාව ඉහළ අගයක් ගන්නා බව මින් පැහැදිලි ය. එනම් උපාධි නිබන්ධන 1232ක් (61.6%) ඉංග්‍රීසි මාධ්‍යයෙන් රචනා වී ඇති අතර සියලු ම පීඨයන් නියෝජනය කරමින් ඉදිරිපත් කොට ඇත. සිංහල මාධ්‍යයෙන් උපාධි නිබන්ධන 763ක් (38.1%) රචනා වී ඇති අතර එම උපාධි නිබන්ධන බොහොමයක් සමාජීය විද්‍යා පීඨයට හා මානව ශාස්ත්‍ර පීඨයට අයත් ඒවා වේ. එසේ ම වෙනත් භාෂාවන්ගෙන් රචනා වී ඇත්තේ ඉතා සීමිත උපාධි නිබන්ධන සංඛ්‍යාවකි. එය වගු අංක 2හි පැහැදිලි ව දක්වා ඇත.

වගු අංක 2: භාෂාව අනුව උපාධි නිබන්ධන

| **භාෂාව** | **පීඨය** | **පීඨය ආරම්භ කළ වර්ෂය** | **නිබන්ධන ප්‍රමාණය** | **එකතුව** | **ප්‍රතිශතය** |
|---|---|---|---|---|---|
| සිංහල | මානව ශාස්ත්‍ර | 1981/82 | 211 | 763 | 38.1% |
| | සමාජීය විද්‍යා | 1981/82 | 550 | | |
| | වාණිජ හා කළමනාකරණ | 1995 | 2 | | |
| ඉංග්‍රීසි | මානව ශාස්ත්‍ර | 1981/82 | 277 | 1232 | 61.6% |
| | සමාජීය විද්‍යා | 1981/82 | 211 | | |
| | වාණිජ හා කළමනාකරණ | 1995 | 505 | | |
| | වෛද්‍ය පීඨය | 1991 | 32 | | |
| | විද්‍යා පීඨය | 1979 | 207 | | |
| වෙනත් | මානව ශාස්ත්‍ර | 1981/82 | 5 | 5 | 0.3% |
| | **එකතුව** | | **2000** | **2000** | **100%** |

(මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023)

බටහිර බංගලි විශ්වවිද්‍යාලයන්හි කරන ලද පර්යේෂණයකින් සනාථ වනුයේ ද ඉංග්‍රීසී භාෂාවෙන් රචිත උපාධි නිබන්ධන ප්‍රමාණය ස්ව භාෂාවෙන් රචිත උපාධි නිබන්ධන ප්‍රමාණයට වඩා ඉහළ බවය (Chakrabarti, 2020). එය අධ්‍යයන නියැදියෙන් 89% ප්‍රතිශතයකි. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ උපාධි නිබන්ධන ආශ්‍රයෙන් සිදු කරන ලද උද්ධරණ විශ්ලේෂණයේ දී අඩු පිරිසක් සිංහල භාෂාව උපයෝගී කර ගත්ත ද වැඩිම විමර්ශන සංඛ්‍යාවක් ලියැවී ඇති භාෂාව ඉංග්‍රීසි වේ (Kodithuwakku 2017).

1960-1980 යන දශකයන්හි පශ්චාත් උපාධි නිබන්ධන විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ පර්යේෂණයන්හි ප්‍රතිඵල වන අතර එය සංඛ්‍යාත්මකව 53කි. එම පර්යේෂණ නිබන්ධනයන් වැඩි සංඛ්‍යාවක් (35) ඉංග්‍රීසී මාධ්‍යයෙන් සිදු වීමත් සුවිශේෂිය. මුල් කාලීනව සිටම භාෂා පීඨය මගින් ඉංග්‍රීසි අධ්‍යාපනය කෙරෙහි දක්වන ලද සැලකිලිමත් බව මෙයට හේතු විය හැකිය. එමෙන්ම එවකට ආචාර්ය මඩුල්ල ලෙස ක්‍රියා කළ පිරිසගේ උගත් හා ප්‍රාමාණික දැනුම ද මහත් අත්වැසිල්ලක් වන්නට ඇත. 1981න් පසුව කැලණිය විශ්වවිද්‍යාලයේ දැනට පවත්නා පීඨ හා අධ්‍යයන අංශ ආරම්භ වීමත් සමග පශ්චාත් උපාධි නිබන්ධනයන්හි කැපී පෙනෙන පර්යේෂණ ඵලදායීත්වයක් හා වර්ධනයක් නිරූපණය කරයි.

මෙම අධ්‍යයනයෙහි තවත් එක් අරමුණක් වනුයේ කැලණිය විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි පර්යේෂණයන්ගේ වර්ධනය පිළිබඳ අවධානය යොමු කිරීම වේ. ඒ අනුව පෙනී යන්නේ පර්යේෂකයින් විසින් පශ්චාත් උපාධි හැදෑරීමේ ප්‍රවණතාවක් ඇති වී ඇත්තේ විසි එක්වන සියවසේ මුල් භාගයේ සිට බවය. චරභාරති (Chakrabarti, 2020) දක්වන පරිදි බටහිර බංගලි විශ්වවිද්‍යාලයන්හි අධ්‍යයනයේදීත් කැපී පෙනෙන ලක්ෂණයක් වනුයේ උපාධි නිබන්ධනයන්ගේ වර්ධන වේගය වැඩි වී ඇත්තේ 2010-2018 අතර කාල සීමාව තුළ වන අතර එය 59% ප්‍රතිශතයකි. මෙම අධ්‍යයනයෙන් 1960-2000 වර්ෂය දක්වා එනම් වසර 40ක කාල පරාසය තුළ උපාධි නිබන්ධන 257ක් හඳුනාගත හැකි අතර වර්ෂ 2001-2005 අතර උපාධි නිබන්ධන සංඛ්‍යාව 200ක් වේ. එසේ ම 2016-2020 වසර 5 තුළ උපාධිධාරීන් 606ක් කැලණිය විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි පීඨයෙන් උපාධි හදාරා උපාධි නිබන්ධන එකතුවට නිබන්ධන එක් කිරීමට සමත් වී තිබේ. පහත ප්‍රස්ථාර අංක 1 අනුව පැහැදිලි වන්නේ 2016-2020 කාලය තුළ පර්යේෂණයන්ගේ ඉතා සීඝ්‍ර වර්ධනයක් දැකගත හැකි බවය. මෙම වර්ධනය ඒ ඒ කාල පරිච්ඡේද තුළ පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වන උපාධි අපේක්ෂකයින්ගේ ප්‍රමාණය මත පදනම් වේ. කෙසේ වුවත්, 1959 විද්‍යාලංකාර පිරිවෙන ආරම්භයේ සිට ම 1998 පශ්චාත් උපාධි අධ්‍යයන අංශය ස්ථාපිත කරන තුරු විද්‍යාලංකාර මණ්ඩපයෙන් සහ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය තුළින් බිහිවූ උපාධි නිබන්ධන සංඛ්‍යාවක් ද මෙම අධ්‍යයනයට අන්තර්ගත වේ. විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ සේවයේ නියුතු ශාස්ත්‍රීය පඬිවරු දේශීය මෙන්ම විදේශීය අධ්‍යාපනය ලැබීමට සමත්කමක් දක්වා තිබිණි. බොහෝ පිරිසක් විදේශීය විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි හැදෑරීමට සහ එම දැනුම නැවත විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයට සැපයීම සිදුකර තිබිණි. කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන අංශය ආරම්භ කිරීමෙන් අනතුරුව විවිධ පීඨ මගින් නව පශ්චාත් උපාධි පාඨමාලා හඳුන්වා දෙමින්, අධ්‍යයන මණ්ඩල පවත්වමින් සාර්ථක ගමනක නියැළේ.

ප්‍රස්ථාර අංක 1: උපාධි නිබන්ධන එකතුවේ වර්ධනය




(මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023)

වගු අංක 3 : අධ්‍යයන පීඨය හා අධ්‍යයන අංශ අනුව උපාධි නිබන්ධන

| ආරම්භ කළ වර්ෂය | පීඨය | අධ්‍යයන අංශ | උපාධි නිබන්ධන ප්‍රමාණය | | | | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල | ඉංග්‍රීසි | වෙනත් | එකතුව | |
| 1995 | වාණිජ හා කළමනාකරණ පීඨය | ගණකාධිකරණ අධ්‍යයන අංශය | | 3 | | 3 | 507 25.4% |
| | | වාණිජ අධ්‍යයන අංශය | 2 | 122 | | 124 | |
| | | වාණිජ හා කළමනාකරණ අධ්‍යයන අංශය | | 130 | | 130 | |
| | | මූල්‍ය අධ්‍යයන අංශය | | 3 | | 3 | |
| | | මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය | | 230 | | 230 | |
| | | අලෙවිකරණ අධ්‍යයන අංශය | | 17 | | 17 | |
| 1981/ 1982 | මානව ශාස්ත්‍ර පීඨය | බෞද්ධ අධ්‍යයනය අධ්‍යයන අංශය | 12 | 10 | | 22 | 493 24.7% |
| | | ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය | 4 | 5 | | 9 | |
| | | නාට්‍ය හා රංග කලාව අධ්‍යයන අංශය | 2 | 3 | | 5 | |
| | | ඉංග්‍රීසි අධ්‍යයන අංශය | | 13 | | 13 | |
| | | ලලිත කලා අධ්‍යයන අංශය | 26 | 5 | | 31 | |
| | | හින්දි අධ්‍යයන අංශය | 3 | 11 | 2 | 16 | |
| | | වාග් විද්‍යා අධ්‍යයන අංශය | 25 | 206 | | 231 | |
| | | නූතන භාෂා අධ්‍යයන අංශය | | 3 | 2 | 5 | |
| | | පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය | 34 | 13 | | 47 | |
| | | සංස්කෘත අධ්‍යයන අංශය | 14 | 3 | 1 | 18 | |
| | | සිංහල භාෂා අධ්‍යයන අංශය | 90 | 6 | | 96 | |
| 1991 | වෛද්‍ය පීඨය | වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය | | 32 | | | 32 1.6% |
| 1981/ 1982 | විද්‍යා පීඨය | රසායන විද්‍යා අධ්‍යයන අංශය | | 62 | | | 207 10.3% |
| | | උද්භිත විද්‍යා අධ්‍යයන අංශය | | 31 | | | |
| | | සංඛ්‍යා හා පරිගණක විද්‍යා අධ්‍යයන අංශය | | 11 | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | කර්මාන්ත කළමනාකරණය අධ්‍යයන අංශය | | 6 | | | |
| | | ගණිත අධ්‍යයන අංශය | | 12 | | | |
| | | ශාක හා අණුක ජීව විද්‍යාව අධ්‍යයන අංශය | | 5 | | | |
| | | භෞතික විද්‍යාව අධ්‍යයන අංශය | | 13 | | | |
| | | ක්ෂුද්‍ර විද්‍යාව අධ්‍යයන අංශය | | 12 | | | |
| | | සත්ත්ව සහ පාරිසරික කළමනාකරණය අධ්‍යයන අංශය | | 55 | | | |
| | | පුරාවිද්‍යාව අධ්‍යයන අංශය | 27 | 8 | | 35 | |
| | | ආර්ථික විද්‍යාව අධ්‍යයන අංශය | 49 | 48 | | 97 | |
| | | භූගෝල විද්‍යාව අධ්‍යයන අංශය | 42 | 24 | | 66 | |
| | | ඉතිහාසය අධ්‍යයන අංශය | 62 | 18 | | 80 | |
| 1981/ 1982 | සමාජීය විද්‍යා පීඨය | ජාත්‍යන්තර අධ්‍යයනය | | 3 | | 3 | 761 38% |
| | | පුස්තකාල හා විඥාපන විද්‍යාව අධ්‍යයන අංශය | 82 | 50 | | 132 | |
| | | ජන සන්නිවේදනය අධ්‍යයන අංශය | 159 | 14 | | 173 | |
| | | දර්ශනය අධ්‍යයන අංශය | 34 | 17 | | 51 | |
| | | දේශපාලන විද්‍යාව අධ්‍යයන අංශය | 7 | 5 | | 12 | |
| | | සමාජ විද්‍යා අධ්‍යයන අංශය | 89 | 23 | | 112 | |

(මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023)

වගු අංක 3ට අනුව, කැලණිය විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි පර්යේෂණයන්ගේ විෂය ක්ෂේත්‍රයන් හා ජනප්‍රිය විෂයයන් මොනවා ද යන්න එම අධ්‍යයන පීඨය හා අධ්‍යයන අංශ අනුව පැහැදිලි කරගත හැකිය. වඩාත් වැඩි ප්‍රතිශතයක් නියෝජනය කිරීම පිළිවෙලින් සමාජීය විද්‍යා පීඨ උපාධි නිබන්ධන 761ක් ද (38%), වාණිජ හා කළමනාකරණ පීඨ උපාධි නිබන්ධන 507ක් ද (25.4%), හා මානව ශාස්ත්‍ර පීඨය උපාධි නිබන්ධන 493ක් ද (24.7%) එකතුවට අයත් වේ. ජන සන්නිවේදන විෂය ක්ෂේත්‍රය හා පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය හදාරන උපාධි පර්යේෂකයන් වැඩි ප්‍රතිශතයක් ලබා ගත්ත ද මානව සම්පත් කළමනාකරණ විෂය ක්ෂේත්‍රයට සම්බන්ධිත උපාධි නිබන්ධන 232ක ප්‍රමාණයක් මෙම අධ්‍යයන කාල සීමාව තුළ දැකගත හැකි වීමෙන් පැහැදිලි වන්නේ කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අපේක්ෂකයින්ගේ ජනප්‍රිය විෂය ක්ෂේත්‍රයක් ලෙස මානව සම්පත් කළමනාකරණ විෂය හැඳින්විය හැකි බව ය. මුල් කාලීනව ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය යටතේ උප අංශයක්ව පැවති වාණිජ විෂය ක්‍රමයෙන් 1980 වර්ෂයේ සමාජීය විද්‍යා පීඨයේ වෙනම අධ්‍යයන අංශයක්ව ස්ථාපිතව පසුකාලීනව වර්ධනය වෙමින් 1995 වන විට වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය ලෙස ස්ථාපනය විය. වාණිජ්‍ය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි 2008 වසරේ සිට ක්‍රමිකව වර්ධනය වී ඇත. 2006 වර්ෂයේ සිට මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, 2010 වසරේ සිට මානව සම්පත් කළමනාකරණ විද්‍යාපති (MHRM) උපාධි පාඨමාලා ආරම්භ විය (කැලණි සරසවි පුනරාවලෝකනය, 2023).

දෙවනුව 231ක උපාධි නිබන්ධන ඇතුළත් වාග් විද්‍යා විෂය ක්ෂේත්‍රය ද ඉන් අනතුරුව පිළිවෙලින් ජන සන්නිවේදන විෂය ක්ෂේත්‍රය හා පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය ක්ෂේත්‍රය ජනප්‍රිය විෂයන් ලෙස මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වේ. මෙවැනි විෂයන් වඩාත් ජනප්‍රිය වීමට හේතුවී ඇත්තේ වෙනත් විශ්වවිද්‍යාලවල වාග් විද්‍යාව, පුස්තකාල විද්‍යාව හා ජන සන්නිවේදනය වැනි විෂයන් පශ්චාත් උපාධි අපේක්ෂකයින්ට අධ්‍යයනය සඳහා නොමැති වීම යැයි අනුමාන කළ හැකිය. එමෙන් ම මෙම විෂය ක්ෂේත්‍ර ආශ්‍රයෙන් වන රැකියා අවස්ථාවන් වැඩි වීම ද තවත් එක් හේතුවකි. වෘත්තීයාභිමුඛ පාඨමාලාවන් ලෙස ආරම්භ කරන ලද ජනසන්නිවේදන විෂයෙහි ශාස්ත්‍රපති, සමාජීය විද්‍යාපති පාඨමාලා ද අනතුරුව දර්ශනපති හා දර්ශන විශාරද උපාධි පාඨමාලා හැදෑරීමට අවස්ථාව 1997න් පසුව උදාවීය. 2000 වර්ෂයේදී මෙම අධ්‍යයන අංශය ස්ථාපනය කරන ලදී (කැලණි සරසවි පුනරාවලෝකනය, 2023). තවදුරටත් වෘත්තීයාභිමුඛ පාඨමාලාවන් අතර පුස්තකාල හා විඥාපන විද්‍යාව ද හඳුන්වා දෙන ලදී. මෙහිදි ජනප්‍රිය විෂයයන් අතර මෙවැනි වෘත්තීයාභිමුඛ විෂයයන් දක්නට ලැබීම එහිම ප්‍රතිඵලයකි.

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන අංශයේ හා වාණිජ අධ්‍යයන අංශයේ විෂය ක්ෂේත්‍ර කෙරෙහි ද වැඩි නැඹුරුවක් මෙහිදි දැකගත හැකිය. මෙම අධ්‍යයනය අනුව ගණකාධිකරණය, මූල්‍ය ක්ෂේත්‍රය හා ජාත්‍යන්තර අධ්‍යයනය යන විෂය ක්ෂේත්‍ර කෙරෙහි පශ්චාත් උපාධි පර්යේෂකයින් දක්වන කැමැත්ත ඉතා අඩු මට්ටමක පවතින බව පැහැදිලිය. සමස්තයක් ලෙස කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි නිබන්ධන ආශ්‍රයෙන් වෛද්‍ය පීඨයේ පශ්චාත් අධ්‍යයන කටයුතු සඳහා යොමුවන පිරිස ඉතා අඩු මට්ටමක පවතී. එය 32 (1.4%) අගයක් ලබා ගන්නා අතර ම විද්‍යා පීඨයේ සමස්ත විෂය ක්ෂේත්‍ර කෙරෙහි දක්වන උනන්දුව ද අඩු මට්ටමක පවතින බව මින් අනාවරණය වේ.

ඉහත දක්වන ලද්දේ අධ්‍යයන අංශ වශයෙන් උපාධි නිබන්ධනයන්ගේ බෙදා දැක්වීම වේ. එය එම පීඨයන් ආරම්භ කළ වර්ෂය අනුව නිබන්ධන ප්‍රමාණයේ වෙනසක් දක්නට ලැබේ. එමෙන්ම විද්‍යාලංකාරයේ සිට පැවති පශ්චාත් නිබන්ධන ද මෙම පීඨ අනුව බෙදා දැක්වීමට සිදුවීය. උපාධි නිබන්ධනයන්ගේ භාවිත යොමු පද (Keywords) අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වනුයේ වගු අංක 4 දක්වා ඇති විෂය කේෂ්ත්‍රයන් පශ්චාත් උපාධි අපේක්ෂකයින් අතර ඉතා ජනප්‍රිය විෂය මාතෘකා වන බවය. ඒ අනුව භාෂාව අනුව වෙන් වශයෙන් ඉදිරිපත් කොට ඇති අතර ඉංග්‍රීසි භාෂාවෙන් රචිත උපාධි නිබන්ධනයන්ගේ ජනප්‍රිය විෂය කේෂ්ත්‍ර ලෙස දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසී භාෂාව, රැකියා කාර්ය සාධනය හා රැකියා තෘප්තිය මෙන් ම වෘත්තිකයා හා වෘත්තිය ලෙස පෙන්වා දිය හැකිය. සිංහල භාෂාවෙන් රචිත උපාධි නිබන්ධන අතර බෞද්ධ ආගම සහ භික්ෂූන්, ශ්‍රී ලංකාවේ ඉතිහාසය මෙන් ම සිංහල භාෂාව හා සාහිත්‍ය ඉදිරියෙන් ම ඇති විෂය කේෂ්ත්‍ර වේ.

වගු අංක 4 : ජනප්‍රිය විෂය කෂේත්‍ර භාෂාව අනුව

| **ඉංග්‍රීසි භාෂාවෙන් රචිත උපාධි නිබන්ධනයන්ගේ ජනප්‍රිය වි ෂය කෂේත්‍ර** | **සිංහල භාෂාවෙන් රචිත උපාධි නිබන්ධනයන්ගේ ජනප්‍රිය විෂය කෂේත්‍ර** |
|---|---|
| දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසී භාෂාව | බෞද්ධ ආගම සහ භික්ෂූන් |
| රැකියා කාර්ය සාධනය හා රැකියා තෘප්තිය | ශ්‍රී ලංකාවේ ඉතිහාසය |
| වෘත්තිය හා වෘත්තිකයා | සිංහල භාෂාව හා සාහිත්‍යය |
| ව්‍යාපාර ව්‍යවසායකත්වය | සන්නිවේදනය |
| බැංකු සහ බැංකුකරණය | ග්‍රාමීය සංවර්ධනය |
| පාරිභෝගික හැසිරීම සහ පාරිභෝගික තෘප්තිය | තොරතුරු තාක්‍ෂණය සහ සංඛ්‍යාංකකරණ බෙදීම |
| තොරතුරු සහ තොරතුරු තාක්‍ෂණය | රූපවාහිනිය සහ සිනමාව |
| ශ්‍රී ලංකාවේ මත්ස්‍ය කර්මාන්තය | ජනශ්‍රැතිය සහ සිංහල සංස්කෘතිය |
| රැකියා දිවියේ සමබරතාවය | පුස්තකාල වර්ග හා ඒ ආශ්‍රිත සේවා |
| ආර්ථික විද්‍යාව | දේශපාලන වාතාවරණය සහ දේශපාලන ගැටළු |

(මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත, 2023)

1997-2003 කාලය තුළ ඉන්දියානු විශ්වවිද්‍යාලය විසින් ප්‍රදානය කරන ලද ආචාර්ය උපාධි නිබන්ධන 164 ක් පරීක්ෂා කර ඉන් වැඩිම නිබන්ධන සංඛ්‍යාවක් ''උපයෝජක අධ්‍යයනය'' සම්බන්ධව සිදු කර ඇත (Mahapatra & Sahoo, 2004). 1984-2015 කාලය තුළ බටහිර බෙංගාලයේ බර්ඩ්වාන් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි නිබන්ධන 33ක් තුළ වැඩිම නිබන්ධන සංඛ්‍යාවක් ''ගණිතමය විශ්ලේෂණය සහ පුස්තකාල ස්වයංක්‍රියකරණය'' පිළිබඳ විෂය ක්ෂේත්‍ර සම්බන්ධ අධ්‍යයන සිදු කර තිබේ (Mondal & Roy, 2017).

ඉහත වගුවෙන් ඉතා සුළු විෂය ක්ෂේත්‍ර ප්‍රමාණයක් නිරූපණය කළ ද මෙම අධ්‍යයනය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සිට වර්තමානය දක්වා වූ පශ්චාත් උපාධි නිබන්ධන ඇගයීමට ලක් කිරීමේ දී පර්යේෂණට භාජනය වූ විෂය ක්ෂේත්‍ර ඉතා විශාල ප්‍රමාණයකි.

**නිගමන**

මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වූයේ කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මගින් පර්යේෂණ ලෝකයට ලබා දෙන්නා වූ දායකත්වය හඳුනා ගැනීම හා පර්යේෂණයන්ගේ වර්ධනය සිදු වී ඇති ආකාරය පිළිබඳ සොයා බැලීම වේ. මෙහි දී තෝරා ගනු ලැබූ කාල පරාසය තුළ උපාධි නිබන්ධනයන් 2000ක් එකතුවට අයත් වන අතර එකී උපාධි නිබන්ධනයන් සියල්ල ම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී. මෙහිදී කැලණිය විශ්වවිද්‍යාලය මගින් පර්යේෂණ ලෝකය සඳහා වන දායකත්වය ඉතා ඉහළ අගයක් ගනු ලබන අතර පශ්චාත් උපාධි නිබන්ධනයන්ගෙන් 95.5%ක ප්‍රමාණයක් විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයෙන් සහ කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන අංශයෙන් එකතුවට එක් කරන ලද නිබන්ධනයන් ය. එමෙන් ම උපාධි ස්වරූපය අනුව පිළිවෙලින් සමාජීය විද්‍යාපති, දර්ශනපති, සහ දර්ශන විශාරද යන උපාධි සඳහා ඉදිරිපත් කරන ලද උපාධි පර්යේෂණ නිබන්ධන වැඩි අගයක් ලබා ගෙන ඇත.

මෙම නිබන්ධන රචනා වී ඇති භාෂාව පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී වැඩිම පර්යේෂණ ප්‍රමාණයක් ඉංග්‍රීසි භාෂාවෙන් රචනා වී ඇති අතර එය 1232 (61.6%)ක් වන අතර සිංහල භාෂාවෙන් නිම කර ඇති සංඛ්‍යාව වනුයේ 763 (38.1%) උපාධි නිබන්ධන ප්‍රමාණයකි. මෙම අධ්‍යයනයෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණයන්ගේ වර්ධනය 2016-2020 කාල පරාසය තුළ ක්‍රමානුකූල වර්ධනයක් දැක ගත හැකි වන අතර වර්ධනයෙහි ඉතා සීඝ්‍ර නැග්මක් පෙන්නුම් කරනුයේ 21 වන සියවසේ මුල් භාගයේ සිටය. මෙම අධ්‍යයනයට අනුව සමාජීය විද්‍යා පීඨයට අයත් පර්යේෂණ ප්‍රමාණය ඉතා ඉහළ අගයක් ලබා ගත්ත ද පිළිවෙලින් මානව සම්පත් කළමනාකරණ විෂය ජනප්‍රිය ම විෂයය ක්ෂේත්‍රය ලෙස නිගමනය කළ හැකිය. දෙවනුව, වාග් විද්‍යා විෂය, තෙවනුව ජන සන්නිවේදන විෂය සහ සිව්වනුව පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය ක්ෂේත්‍ර ජනප්‍රිය විෂය ක්ෂේත්‍ර ලෙස මෙම අධ්‍යයනය තුළින් අනාවරණය කර ගත හැකිවිය.

කෙසේ වෙතත්, වෛද්‍ය පීඨයේ පශ්චාත් උපාධි හා විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ සඳහා යොමු වන පර්යේෂකයින් පිරිස ඉතා අවම මට්ටමක පවතින බව ද මින් නිගමනය කළ හැකිය. කැලණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ඵලදායීතාව හා වර්ධනය පිළිබඳව විමසීමේදී කලා විෂය ධාරාවේ සිට වාණිජ හා කළමනාකරණ විෂය ක්ෂේත්‍ර වෙත පිවිසෙන පර්යේෂකයින් වැඩි ප්‍රමාණයක් හඳුනාගැනීමට හැකි වීය.

**යෝජනාඃ**

මෙම අධ්‍යයන තුළින් සිදු කළ හැකි යෝජනා වනුයේ කැලණිය විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟින් පර්යේෂකයින් වෙත නව විෂය ක්ෂේත්‍රයන් හා ඒ ආශ්‍රිත පර්යේෂණ අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමත්, මේ වන විට ඉතා ජනප්‍රිය විෂය ක්ෂේත්‍ර හා අධ්‍යයන පීඨයන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට හැකි වන ආකාරයට දත්ත පදනම් නිර්මාණය කිරීමත් වේ. එසේ ම පර්යේෂණ ඵලදායීතාව හා වර්ධනය මෙන්ම පර්යේෂකයින්ගේ විෂය ක්ෂේත්‍ර තෝරා ගැනීම සඳහා නිවැරදි මඟ පෙන්වීමක් සිදු කිරීමට පුස්තකාලයාධිපතිවරුන් සතු වගකීමකි. මෙහි දී නිවැරදිව හා ක්‍රමානුකූල ව පශ්චාත් උපාධි නිබන්ධන පිළිබඳ දත්ත පදනම් පවත්තා ගෙන යාමත්, වර්තමානයේ පවතින පර්යේෂණ අවශ්‍යතා සහ නව ප්‍රවණතා පිළිබඳ පශ්චාත් උපාධි පර්යේෂකයින් දැනුවත් කිරීම හා යොමු කරවීම තුළින් විෂය ක්ෂේත්‍රයන්හි සමතුලිතභාවට රැක ගැනීමට අවස්ථාව උදාවේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

ජයසුන්දර, සි. (2023). කැලණිය සරසවියේ ගමන් මග : සංක්ෂිප්ත විමසුමක් තුළ. *කැලණි සරසවි පුනරාවලෝකනය,* කැලණිය විශ්වවිද්‍යාලය.

කැලණි සරසවි පුනරාවලෝකනය (2023). කැලණිය විශ්වවිද්‍යාලය.

කුමාරසිංහ, කේ. (2008). මානව ශාස්ත්‍ර පීඨය. කැලණිය විශ්වවිද්‍යාලය. 25 පි. 16

Abramo, G., D'Angelo, C.A. (2014). How do you define and measure research productivity? Scientometrics, 101(2), 1129-1144. DOI: 10.1007/s11192-014-1269-8 Journal of the University Librarians Association of Sri Lanka, Vol.23, Issue 1, January 2020, 91-118 DOI: http://doi.org/10.4038/jula.v23i1.7968

Angammana, A.M.S. & Jayatissa, L.A. (2015), A bibliometric study of postgraduate theses in Library and Information Science: with special reference to University of Kelaniya and University of Colombo, Sri Lanka, Journal of the University Librarians' Association, Vol.19 (1), 32-53p.

Aponsu, G.M.R.D. (2017). Sri Lanka In: Productivity in Higher Education Research insights for universities and governments in Asia. Asian Productivity Organization. Tokyo. 216-247

Aslam, M. (2017). Current trends and issues affecting academic libraries and leadership skills. Library Management, 39(4), 78-92. https://doi.org/ 10.1108/LM-10-2016-0076

Aydemir, A.G.K. & Can, G. (2019). Educational technology research trends in Turkey from a critical perspective: an analysis of postgraduate theses. *British Journal of Educational Technology*, 50 (3), 1087-1103. doi:10.1111/bjet.12780.

Bornmann L., & Leydesdorff L. (2013). Macro-indicators of citation impacts of six prolific countries: Incites data and the statistical significance of trends. PLoS One, 8(2). https://doi.org/10.1371/journal.pone.0056768

Cambridge Dictionary, (2023). What is the Research or definition? https://dictionary.cambridge.org/dictionary/english/research. [Accessed. 10 November 2023].

Chakrabarti, K. (2020). A trend analysis of the Doctoral dissertations in LIS research in West Bengal, India during 1979-2018. DigitalCommons@University of Nebraska - Lincoln. https://digitalcommons.unl.edu/libphilprac/4149

Chatterjee, A., Rath, P.N. & Poddar, A. (1995). Research trends in Library and Information Science in India. Annals of Library Science and Documentation, 42 (2), 54-60.

Erfanmanesh, M., Tahira, M., & Abrizah, A. (2017). The publication success of 102 nations in Scopus and the performance of their Scopus-indexed journals. Publishing Research Quarterly, doi: 10.1007/s12109-017-9540- 5.

Ferretti, F., Pereira, Â. G., Vértesy, D., & Hardeman, S. (2018). Research excellence indicators: time to reimagine the 'making of'? *Science and Public Policy*, *45*(5), 731–741. https://doi.org/10.1093/scipol/scy007

Gadhoum, Y., & Karam, Y. (2016). The determinants of research productivity in public versus private Saudi universities. Asia Pacific Journal of Advanced Business and Social Studies, 2(2), 625-660.

Günay, Asli and Haliloğlu, Ebru Yüksel (2018). A case study on measuring research efficiency of public universities in Turkey. Journal of University Research, 1(2), 36-42.

Islam, S., Islam, N. & Mondal, M. (2018), Research trends in Library and Information Science in Bangladesh: an analytical study, Journal of Information Science Theory and Practice, 6 (2), 36-45, https://doi.org/10.1633/JISTaP.2018.6.2.3.

Jager, P.D. & Frick, B.L. (2016). Accounting doctorates produced in South Africa 2008-2014. *Meditari Accountancy Research*, 24 (3), 438-457. DOI 10.1108/MEDAR-06-2015-0033.

Jeon, Kyeong-Deok & Park, Sun-Jung (2020). Analysis of research trends in the well-dying of the Korean elderly (2009-2020). *Asia Life Sciences*, 29 (2), 223-234. http://web.b.ebscohost.com/ehost/detail/detail?vid=17&sid=19ac3017-51f1-4f15 b58aeb2394dc2ec0%40pdcsessmgr03&bdata=JnNpdGU9ZWhvc3QtbGl2ZQ%3d%3d#AN=146124295&db=a9h

Kang, C.,Wang, G., Shi, M. & Sun, F. (2014). Research trends on higher education in China for the past ten years. *International Journal of Educational Management,* 28 (3), 319-339. doi:10.1111/bjet.

Kodithuwakku, A.K.U.N. (2017). A glimpse for the collection development though citation analysis of theses for the national library of Sri Lanka. In. Proceeding of national library research symposium. 43-58p.

Mahapatra, R.K. & Sahoo, J. (2004). Doctoral dissertations in library and information science in India 1997-2003: a study. Annals of Library and Information Studies, 51(2), 58– 63.

Marchant, T. (2009): Professional Doctorate Research in Australia: Commentary and Case Studies from Business, Education and Indigenous Studies. Griffith Research Online. http://dps.scu.edu.au/index.php/9/ (Accessed 2 February 2020).

Mondal, S. & Roy, B. K. (2017). Doctoral degree in Library and Information Science in The University of Burdwan during 1984-2015: an analytical study. International Research: Journal of Library & Information Science, 7(4), 735-745.

Monsura, M. P., Dizon, R. L., Tan, C. G., Gapasin, A. R. P., & Testor, T. O. (2022). Why Research Matter?: An Evaluative Study of Research Productivity Performance of the Faculty Members of the Polytechnic University of the Philippines. *Journal of Pharmaceutical Negative Results*, 680–694. https://doi.org/10.47750/pnr.2022.13.s06.097

Niemczyk, E. K. & Rossouw, J. P. (2019): Drives towards research productivity: international trends. In J. P. Rossouw & E. de Waal (Eds.) Human rights in diverse education contexts (pp. 283-309). Pretoria: AOSIS.

Punchihewa, C.N.D. (2014). Citation analysis of masters' theses as a collection development tool: case study at university of Moratuwa, Sri Lanka. NILIS Research Symposium (NILIS 2014). 45-54p.

Rambe, P. (2023). Research excellence and productivity for global impact at an African university. *Studies in Higher Education*, 1–28. https://doi.org/10.1080/03075079.2023.2265931.

Rossouw, J. P. (2020). Developing a Faculty Research Culture in Higher Education: A South African Perspective. *In. Educational Reforms Worldwide. BCES Conference Books*, Volume 18. Sofia: Bulgarian Comparative Education Society.

Sureni (2017). Citation analysis Library and information science research output for collection development. *In. Journal of the University Librarians Association of Sri Lanka.* Vol. 20. Issue 1. DOI: 10.4038/jula.v20i1.7893

Wijetunga, P. (2011), Fifty years of LIS education in Sri Lanka: a retrospective examination, *Sri Lanka Library Review*, 25, https://www.researchgate.net/publication/309825616_Fifty_years_of_LIS_education_in_Sri_Lanka_a_retrospective_examination

Wijetunge, P., Silva, A., & Manatunga, P. K. S. (2020). Research productivity of the state universities of Sri Lanka, a case based on SciVal and the contribution of the libraries towards excellence. *Journal of the University Librarians Association of Sri Lanka*. https://doi.org/10.4038/jula.v23i1.7968

Wijetunge, P. (2021). Research productivity of Sri Lankan universities in the international ranking systems and mandatory contribution of librarians. *DESIDOC Journal of Library & Information Technology*, *41*(1), 54–60. https://doi.org/10.14429/djlit.41.1.16459